කොවිඩ්-19 සම්බන්ධයෙන් වාර්තා කිරීමේදී මාධ්‍ය විසින් පිළිපැදිය යුතු යැයි ඉල්ලා සිටිනා නිර්දේශ මාලාවක් රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව මගින් ප්‍රකාශයට පත් කරන්නට යෙදිණි.

"කොවිඩ්-19 ආසාදිත රෝගියෙකු මියගිය අවස්ථාවේදී විශේෂයෙන්ම ආදාහනය සිදු කරන දර්ශන පෙන්වීමේදී අදාළ දේහය ආදාහනාගාරයට රැගෙන යන අයුරු පෙන්වීම මගින් සහ ආදාහනය කිරීමට සූදානම් වන අවස්ථාවේදී එම මෘත ශරීරය බහාලූ පෙට්ටිය ආදාහනාගාරයට ඇතුලත් කර යන්ත්‍රය ක්‍රියාත්මක කිරීමට පෙර අදාළ පිරිස් ඇඳ සිටි ආරක්ෂිත කබා සහ අත්වැසුම් ආදිය ඉවත්කර ඒ තුලට දමන දර්ශන මගින් මියගිය පුද්ගලයාට යම් අගෞරවයක් සිදුවන බැවින්, එම තත්වය මග හරවා ගැනීම සඳහා අත්‍යාවශ්‍ය නම් දේහය සුසාන භූමිය වෙත රැගෙන එන දර්ශන පමණක් විකාශය කරන ලෙස" කරනු ලබන ඉල්ලීමක් එහි ඇතුළත් වේ.

පහත දැක්වෙන්නේ ඔක්තෝබර් 24 සිට නොවැම්බර් 24 දක්වා කාලයේ සතියේ දිනයන් තුළ, තෝරාගත් සිංහල භාෂා රූපවාහිනී නාලිකා රාත්‍රී ප්‍රධාන පුවත් විකාශයන් තුළ උක්ත නිර්දේශය කඩ කෙරී තිබූ වාර ගණනයි. මෙම පුවත් විකාශයන් තුළ එවන් දර්ශන සෘජුවම විකාශය කෙරී තිබූ අතර, ඇතැම් පුවත් විකාශයක එම දසුන් යම් ආකාරයකින් බොඳ කිරීමට දැරූ අසාර්ථක ප්‍රයත්නයන්ද විණි.

එසේම නොවැම්බර් 03 වැනි දිනෙන් පසුව බොහෝ රූපවාහිනී නාලිකාවන්හි පුවත් විකාශයන් තුළ මෙම ආචාර ධර්ම උල්ලංඝයන් සැලකිය යුතු ලෙසින් පහත වැටී ඇති බවද සුභවාදී කරුණක් ලෙසින් නිරීක්ෂණය විණි.

අවසන් වශයෙන්, මෙම නිර්දේශය පැනවී ඇත්තේ මියගිය අයට සිදුවන යම් අගෞරවයක් වැළැක්වීමට සහ ඒ ඔස්සේ මියගිය අයගේ සමීපතමයන්ට ඇති විය හැකි සිත් වේදනාවක් වැළැක්වීම සඳහා බව පවසන අතරම, මෙවැනි සංවේදී කාරණාවන්ට විශේෂ අවධානයක් යොමු කරමින්, කොවිඩ්-19 සම්බන්ධ වාර්තාකරණයන් සිදු කිරීම මාධ්‍ය අත රැඳි වගකීමක් බවද මෙලෙසම සිහිපත් කරමු.

මූලාශ්‍ර:
[https://mcusercontent.com/.../76820bda-4513-4f3d-9d49...](https://mcusercontent.com/.../76820bda-4513-4f3d-9d49...)

**#MediaEthicsSL #lka #News #COVID19#Coronavirus #TVchannels #Rupavahini #ITN#Swarnavahini #SirasaTV #HiruTV#TVDerana**